# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# தேசிய இரத்தினக்கல்,ஆபரண அதிகாரசபை

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

# NATIONAL GEM AND JEWELLERY AUTHORITY

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT


12,මැක්සන්ස් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය,කොළඹ 03,
12, மெக்சன் கோபுரம் அல்பிரட் அவுஸ் காடுன்ஸ்இ கொழும்பு 03
12, Macksons Tower, Alfred House Gardens, Colombo 03

දුරකථන / தொலைபேசி / Tel: 011-2325364, 011-2329295, 011-2390645 – 8

ෆැක්ස් / தொலைநகல் / Fax: 0112320758


මගේ අංකය / எனது இல. / My No.: NGJA/8.2/NGR

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025.07.08

**අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2602 (2025.04.10) ට අදාලව මෙරටදී අගය එකතු කල නොහැකි රළු මැණික් පාෂාණ අපනයනය සඳහා වන මාර්ගෝපදේශය**

1. අපනයනය කරනු ලබන රළු මැණික් ගල්වල FOB වටිනාකමට සරිලන වලංගු මැණික් වෙළෙඳ බලපත්‍රයක් තිබිය යුතුය. (NGJA - GDL)

2. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් නිකුත්කල එම මැණික් වෙළෙඳ බලපත්‍රයේ සඳහන් පුද්ගලික නමට හෝ ආයතනයේ නමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන TIN සහ VAT අංක ලබාගෙන තිබිය යුතුය.

3. අපනයනකරු / අපනයන ආයතන ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආසිකුඩා පද්ධතිය හරහා රේගු ප්‍රකාශය (Custom Declaration) යොදා තිබිය යුතුය.

4. මෙම වර්ගීකරණයට අයත් රළු මැණික් ගල් ශ්‍රී ලංකාව තුළ වෙන්දේසිය (Rough Gemstone Auction) කට ඉදිරිපත් කල යුතු අතර එම වෙන්දේසියෙන් නොවිකිණී ඉතිරිවන රළු මැණික් පාෂාණ පමණක් අපනයනය සඳහා ඉදිරිපත් කල යුතුය.

5. ඉහත 04 න් දක්වා ඇති කාරුණ සපුරාලිය නොහැකි නම් මෙම වර්ගීකරණය යටතේ සිදුකරනු ලබන රළු මැණික් පාෂාණ වල අපනයන ඉන්වොයිසියෙහි සඳහන් CIF අගයට අදාලව මෙරටට විදේශ මුදල් ගෙන්වාගෙන තිබිය යුතුය (Advanced Payment). අපනයනය කරන අවස්ථාවේදී එම බැංකු ලේඛන අපනයන අංශයට ඉදිරිපත් කිරීම අනිවර්යය වේ.

6. සතියේ දින පහේම (05) අපනයන සිදුකල හැකි අතර අපනයන කිරීමට බලාපොරොත්තුවන දිනයට රාජකාරි දින දෙකකට පෙර ඉල්ලීම් ලිපියක් මඟින් අපනයන අංශය දැනුවත් කල යුතුය.

7. අපනයනය සිදුකරන දින මධ්‍යහන 12.00 ට පෙර අපනයන ඉන්වොයිසි අදාල අයිතමයන් සමඟ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් මැණික් පරීක්ෂාකිරීමේ රසායනාගාරය වෙත ඉදිරිපත්කර තිබීම අනිවාර්යය වේ.

8. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාර නිලධාරින්ගේ අවශ්‍යතාවය මත සාම්පල් ලබාගත හැකිය. අවශ්‍ය නම් ඡායාරූප ලබාගත යුතුය.

9. මෙම වර්ගීකරණයෙන් අයකරනු ලබන සේවා ගාස්තුව අපනයන වටිනාකමින් (FOB) 1% කි.


සභාපති / தவிசாளர் / Chairman: Tel. : 011-2390650 / 011-2329352; Fax : 011-2328936 / 011-2320971; E-mail: chairman@ngja.gov.lk

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: Tel. : 011-2441188; Fax : 011-2329697; E-mail : dgsec@ngja.gov.lk

තැ.පෙ. අංකය / த.பெ.இல. / P.O. Box: 279

Website: www.ngja.gov.lk

10. මෙම වර්ගීකරණයේ අපනයන සේවා ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා රුපියල් වලින් විය යුතුය.

11. මෙම වර්ගීකරණයේ අපනයන සිදු කල හැක්කේ කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පමණි.

12. රළු මැණික් ගල් පරීක්ෂා කර අපනයනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ කමිටුව පහත පරිදි වේ.

   I. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ මැණික් පරීක්ෂා කිරීමේ රසායනාගාරයේ තක්සේරු/ රත්නවිද්‍යාඥ නිලධාරින් - 02

   II. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනයේ නිලධාරින් - 01

   III. අපනයන අංශයේ / අපනයන ප්‍රවර්ධන අංශයේ නිලධාරින් - 01

13. එම කමිටුව අධ්‍යක්ෂ (අපනයන සේවා හා අපනයන අලෙවි) විසින් නම්කල යුතු අතර තක්සේරු / රත්නවිද්‍යාඥ නිලධාරින් දෙදෙනා අධ්‍යක්ෂ (තක්සේරු / රත්නවිද්‍යාඥ) එකඟතාවය මත ලබාගත යුතුය.

14. එම කමිටුවේ පැහැදිලි ලිඛිත නිර්දේශමත, අධ්‍යක්ෂ (අපනයන සේවා හා අපනයන අලෙවි ), අධ්‍යක්ෂ (ඉඩම් කැනීම් හා පරිසර ) , අධ්‍යක්ෂ ජනරාල් / සභාපති යන කවර හෝ නිලධාරියකුගේ අනුමැතිය මත අපනයනයන සිදුකල හැකිවේ.

15. තක්සේරු මේසයේදී අපනයන පාර්සලයක මිල ඉහල දැමූ අවස්ථාවක බාධාවකින් තොරව අපනයනකරුට / අපනයන ආයතනයට තම අපනයන පාර්සලය ඉවත් කර ගැනීමේ හැකියාව ඇත.

16. අපනයනය සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදීමේ නිර්දේශය කමිටුව මඟින් ලිඛිතව ලබාදිය යුතු අතර එම අපනයනය සිදු නොකිරීමේ අවසන් තීරණයද කමිටුව සතු වන අතර ඒ සම්බන්ධයෙන් අපනයන්කරු / අපනයන ආයතනය සෑහීමකට පත් නොවන අවස්ථාවකදී අධ්‍යක්ෂ ජනරාල් /සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි වෙත පැමිණිලි කිරීම / අභියාචනා කිරීමට අපනයනකරුට අවස්ථාව ඇත.

17. රළු මැණික් ගල්වල මිල හා එකවරකට අපනයනය කල හැකි විවිධ රළු මැණික් වර්ගීකරණයට අදාල වගුව මේ සමඟ අමුණා ඇති අතර ඊට අනුකූලව ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරින් සහ අපනයනකරුවන් කටයුතු කල යුතුය.

18. මෙම වර්ගීකරණයට අදාලව අපනයන සිදු කිරීමේදී මින් පෙර සිදු කරන ලද සාමාන්‍ය අපනයනවල විදේශ ප්‍රේෂණ (Remittance) , අපනයන සිදුකර දින 180 ක් සම්පූර්ණවීමට පෙර මෙරටට ලැබිය යුතු අතර, එම විදේශ ප්‍රේෂණ වලට අදාල, බැංකු විසින් නිකුත් කරන ලද වාර්තා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අපනයන අංශය වෙත ඉදිරිපත් කල යුතුය.

19. මෙම රළු මැණික් අපනයනය සිදු කිරීමේදී අත්තිකාරම් ගෙවීම් (Advanced Payment) පදනම මත විදේශ ප්‍රේෂණ මෙරටට ගෙන්වා ගත් බවට අදාල ලේඛන අපනයන අංශයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපනයනකරු / අපනයන ආයතනයට මෙම 1% (NGR Category) වර්ගීකරණය යටතේ අපනයනය කිරීමට අවසර ලබා දෙනු නොලැබේ.

20. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරින් අපහසුතාවයකට පත්කර එම නිලධාරින් රවටා වංචා සහගත ලෙස මෙම වර්ගීකරණය යටතේ අපනයනය සිදු කිරීමට තැත්කරණ අපනයන ආයතනවල / අපනයනකරුවන්ගේ මැණික් වෙළෙඳ බලපත්‍රය අත්හිටුවීමට කටයුතු කල හැකිය. ඒ සඳහා නිර්දේශ අධ්‍යක්ෂ (අපනයන සේවා හා අපනයන අලෙවි) සහ අධ්‍යක්ෂ (තක්සේරු /රත්නවිද්‍යාඥ) යන දෙදෙනාම විසින් අධ්‍යක්ෂ ජනරාල් / සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි වෙත ලිඛිතව වාර්තා කල යුතුය.

නවීන් සූරියආරච්චි

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි